**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2019**

**------------------------------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.12,354,598 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ආයෝජන මුදල් ප්‍රවාහය නිවැරදිව දක්වා ඇත. වර්ෂය තුළ වත්කම් අත්පත් කර ගැනීම්වල අගය රු.72,323,199 කි. එම ප්‍රමාණයෙන් වර්ෂයේ ලද පරිත්‍යාග වටිනාකම රු.304,735 ක් හා විවිධ ණය හිමියන්ගේ අගය වන රු. 9,880,645 ක වටිනාකමේ එකතුව අඩු කිරීමෙන් පසු අගය රු.62,156,162 ක මුදල වත්කම් අත්පත් කර ගැනීම යටතේ දක්වා ඇත. | වත්කම් මිලදී ගැනීමේදී ජනිත වූ ණයහිමියන්ගේ ආරම්භක ශේෂය ගැලපීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ)සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු. 22,979,374 ක් වූ පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය කිරීමට හෝ ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | පුස්තකාල පොත්වල ඵලදායී ජීවිත කාලය නිර්ණය කිරීම ඉතාමත් අපහසු වේ. එමෙන්ම පොත් ප්‍රත්‍යාගණනය කිරීමට විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයින් අඩු වීමට, විශාල පොත් වෙළඳපොළ අගය මත ඇගයීම, නිශ්චය,තොගයක් පැවතීම කිරීමේ අපහසුව හා ඒ සඳහා යන කාලය මෙන්ම වියදම ද සලකා බලන කල මෙය ප්‍රායෝගික නොවන තත්ත්වයකි. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩාගාරයේ බිම් ඇතිරිලි මිලදී ගැනීම සඳහා ගෙවියයුතු රු.760,437 ක් මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් යටතේ දක්වා නොතිබුණි. | ගබඩා ද්‍රව්‍ය ලැබීම් කුවිතාන්සි අංක 4119 හි සඳහන් වටිනාකමින් රු.192,000 ක් වටිනා Table Tennis Flooring Mat සහ Gym ball set හි අගය වන රු. 9,450 යන අගයන් ප්‍රාග්ධනිත කර නොමැත රු.694,737 වටිනාකම පුනරුත්ථාපන වියදම් )Rehabilitation Expenses) වන අතර රු.65,700 ක මුදල පුනරාවර්තන වියදම් වේ. එමෙන්ම 4085 යටතේ වන රු.558,987 වටිනා Rubber Carpet හා Yoga mat ද ප්‍රාග්ධනිත කර නොමැති බැවින් ඉතිරි මුදල වන රු.1,940,355 ක් ක්‍රීඩා උපකරණ යටතේ ගිණුම්ගත කර ඇත. | නිවැරදිව උපචිත වියදම් ගිණුම්ගත කළ යුතුය. |

**1.6 නීතිරීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2019 සැප්තැම්බර් 20 දින ආයතනය සම්බන්ධයෙන් පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග | | | |
| නියෝග අංක 05 | 2018 අංක 19 දරන ජාතික විගණන පනත අනුව විශ්වවිද්‍යාල යටතේ පවතින සියලුම ආයතනවලට වෙනම අභ්‍යන්තර විගණන ඒකක පවත්වා ගැනීමට අත්‍යාවශ්‍ය බව අවධාරණය කළ කාරක සභාව එයට අනුකූලව ආයතනයට දැරිය හැකි පිරිවැය සීමාව තුළ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අභ්‍යන්තර විගණන තනතුරක් ඇති කිරීම සඳහා අවසර ඉල්ලා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලුම් කර ඇත. | කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| නියෝග අංක 13 | සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රවනතාවයක් පවතින බැවින් උපාධිය සම්පූර්ණ කර පිටව යන සිසුන් සම්බන්ධ තොරතුරු සහ ඔවුන් වර්තමානයේ සම්බන්ධ වී ඇති ක්ෂේත්‍ර පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීමට නිර්දේශ කර තිබූ නමුත් එම දත්ත පද්ධතිය සකස් කර නොතිබුණි. | පාඨමාලා හැර යන සිසුන් පාඨමාලා හැර යාමට හේතු වූ කරුණු හා ඔවුන්ගේ වර්තමාන තත්වය ඇතුළත් දත්ත පද්ධතිය සකස් කර ඇත. | කාරක සභා නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 756 වන මුදල් රෙගුලාසිය | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල වෙත 2014 ජුලි 31 දින භාරදී තිබූ රු.1,659,145ක් වටිනා වෛද්‍ය උපකරණ සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. | භාණ්ඩ ලේඛන පවත්වාගෙන යාම රෝහලේ කාර්යක් වුවත් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් එම භාණ්ඩ පරික්ෂා කර පැවැත්ම තහවුරු කරගෙන ඇත. ඉදිරියේදී එම කටයුතු තවදුරටත් නිවැරදි කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 140,992,411 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 25,724,695 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 115,267,716 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් වියදම් රු. 217,478,692 කින් විශාල ලෙස ඉහළ යාමත් මෙහෙයුම් ආදායම රු. 101,210,976 ක් වැනි සාපේක්ෂව කුඩා ප්‍රමාණයකින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 24 ක සිට ශිෂ්‍ය නේවාසිකාගාරය පවත්වාගෙන ගිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහිත ඉඩම දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට පවරා ගැනීමට 2019 අගෝස්තු මස 28 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට ලැබී තිබුණු මුදල් අමාත්‍යාංශ නිරීක්ෂණ අනුව මෙම ඉඩම 2014 පෙබරවාරි 14 දින නාගරික සංවර්ධන අධිකාරියට පවරාදී ඇති නිසා එහි කැමැත්ත ලබා ගෙන ඉඩම පවරා ගන්නා ලෙස දන්වා තිබුණද එසේ පවරා ගෙන නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතුව තිබූ මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම 2014/01/27 දිනැති අංක 1-132/503/13/1735 දරන කැබිනට් පත්‍රිකාව මඟින් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති අතර 2019/08/29දිනැති අංක 095/110/2221/19 දරන පත්‍රිකාව මඟින් උසස් අධ්‍යාපන කැබිනට් අමාත්‍යාංශ යට පවරා ඇත. ඉදිරියේදී කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බදු ගොඩනැගිල්ලක කොටසක් කඩා ඉවත්කර රු. 1,991,507 ක වියදමක් දරා කියවීමේ ශාලාවක් ඉදිකර 2019 ජූලි 23 දින ආයතනයට බාරදී තිබූ නමුත් විගණිත දිනය වූ 2020 සැප්තැම්බර් 08 දින දක්වාම එම ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි. | මේ පිලිබඳව ආයතනයේ වැඩ අධිකාරිවරයා සහ පරිපාලක (සිවිල්) නිර්දේශ පරිදි ලබාගෙන ඇති අතර ඉදිරියේදී එවැනි ඉදිකිරීම්වලට අදාළ අංශ ප්‍රධානින්ගේ නිර්දේශද ලබා ගැනීමට කටයුතු කරමි. | ප්‍රතිලාභ ලැබිය හැකි තත්ත්වයට පත් කළ යුතුය. |
| (ආ) රුපියල් 6,538,929 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක අක්‍රමිකතා සිදුවී ඇති බව අනාවරණය වූයෙන් | මුදල් කමිටුවේ තීරණය පරිදි වීධිමත් පරීක්ෂණයක් සිදු නොකළ | කමිටු නිර්දේශ සැලකිල්ලට ගත |

| | | |
|---|---|---|
| 2019 මැයි 06 දිනැති මූලික විමර්ශන කමිටුව වාර්තාවෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට නිර්දේශ කර තිබුණද විධිමත් පරීක්ෂණයක් 2020 සැප්තැම්බර් 08 දින වන විට ද පවත්වා නොතිබුණි. මෙහි ඇතුළත් කොන්ත්‍රාත් 03 ක් සඳහා ගිවිසුම් ප්‍රකාරව අය කළ යුතු රු.652,092 ක් වූ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | බව මෙමගින් දන්වා සිටිමි. ආයතනයේ සිසු අරගල, අනධ්‍යාන සේවක වර්ජනය, පාස්කු ප්‍රහාරය වැනි කරුණු කොන්ත්‍රාත්තු ප්‍රමාද වීමට හේතු වූ හෙයින් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කර නොමැත. | යුතු අතර ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙහි පැවතුණු ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටම් ඇතුළු තනතුරු 15 ක පුරප්පාඩු 67 ක් සම්පූර්ණ කර නොතිබුණි. | මෙම තනතුරුවලින් වැඩ සහායක, සෞඛ්‍ය සේවා කම්කරු, පොත් තබන්නා, විනයාරක්ෂක නිලධාරි ඇතුළු තනතුරු 32 ක් සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදුකර පාලක සභාවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. රටතුළ පැවති මැතිවරණ කාල වකවානුව අවසන් වන තෙක් බඳවා ගැනීම් නතර කර තිබුණි. | තනතුරු සංඛ්‍යාව හා පවත්නා පුරප්පාඩු සමාලෝචනය කර අවශ්‍යතා හඳුනාගෙන බඳවාගැනීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1** වාර්ෂික ක්‍රියාකාරී සැළැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැළැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ළඟාකර ගැනීමට අපේක්ෂිත තත්ත්වයන් පිළිබඳ නිශ්චිත කාලරාමුවක් සහ එම කාල රාමුව තුළ ඉටුකිරීමට අපේක්ෂිත තත්ත්වය ප්‍රමාණාත්මකව දක්වා නොතිබීම හේතුවෙන් භෞතික කාර්යසාධනය ඇගයීම් කිරීමට නොහැකි විය. | විගණනය විසින් පෙන්වන කරුණු ඇතුළත් කර ක්‍රියාකාරී සැලසුම් නිසි පරිදි පිළියෙල කර ඇත. | කාර්යසාධනය ඇගයීමට හැකි පරිදි ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතුය. |

**5.** තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ආයතනය විසින් දැනුවත් වී තිබුණ ද ආයතනයට අදාළ කර ගත හැකි. තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද එම ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනය විසින් පෙන්වා ඇති පරිදි තිරසාර සංවර්ධන පිළිබඳ අරමුණු හා පරමාර්ථ හඳුනා ගැනීමට කටයුතු කර ඇත. | ආයතනයේ ක්‍රියාකාරී සැළැස්මට තිරසර සංවර්ධන ඉලක්ක හා දර්ශක (KPI) ඇතුළත් කළ යුතුය. |